## වාහන සහ සතුන් පිළිබඳ බදු ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය



**07.1 හැඳින්වීම**

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පවතින මංමාවත් සකස් කර දීමෙන් ජනතාවට ලැබෙන සේවාව සැලකිල්ලට ගනිමින්, ඒ මංමාවත්වල ධාවනය කරන නැතහොත් ගමන් කරවන ඇතැම් වර්ගයේ වාහන සහ සතුන් හිමිකරුවන්ගෙන් පළාත් පාලන ආයතනය වෙත අය කර ගැනීමට නීතිමය ප්‍රතිපාදන සලස්වා ඇති බද්දකි.

**07.2 නෛතික අධිකාරිය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ හතර වන උප ලේඛනය

**07.3 සුදුසුකම්**

පහත දැක්වෙන යම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම, ඒ වාහනය හෝ සතා තම සන්තකයේ හෝ භාරයෙහි හෝ පාලනය යටතේ තබා ගන්නා එක් එක් තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව ඇතුළත ඒ වාහනය හෝ සතා තබා ගෙන සිටි හෝ ප්‍රයෝජනයට ගනු ලැබූ කාලය දින 30 ඉක්මවූ වහාම මේ බද්දට ගෙවීමට ඒ තැනැත්තා යටත් වේ.

**වාහන:**

(අ) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව මෝටර් වාහනයක් නොවන සෑම වාහනයක් ම;

(ආ) බයිසිකල් හෝ ට්‍රයිසිකල්හෝ බයිසිකල් කාර් හෝ කරත්ත හෝ අත් කරත්ත හෝ රික්ෂෝ.

**සතුන්:**

අශ්වයන්, පෝනි, කොටළුවන් සහ ඇතුන්.

සටහන:

1.විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මේ බද්ද ගෙවීමට යටත් නොවේ.

2. යම් තැනැත්තකු විසින් ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව ඇතුළත, යම් වාහනයක් හෝ සතෙකු තම සන්තකයේ හෝ භාරයෙහි හෝ පාලනය යටතේ තබා ගෙන සිටින හෝ ප්‍රයෝජනයට ගනු ලබන කාලය දින 30 ට අඩු වන අවස්ථාවක, ඒ තැනැත්තා මේ බද්ද ගෙවීමට යටත් නොවේ.

3. පහත සඳහන් යම් වාහනයක් හෝ සතෙකු, එනම් -

(අ) රජයේ හෝ ප්‍රාදේශීය සභාවේ දේපළක් වන යම් වාහනයක් හෝ සතෙකු;

(ආ) වෙනත් යම් කාර්යයක් සඳහා භාවිතා නොකර සද්භාවයෙන් ක්‍රියා කරන වාහන වෙළෙන්දන් විසින් විකිණීම සඳහා තබා ඇති වාහන; සහ

(ඇ) රථවාහන පනතේ 3 වන වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තුවකට හෝ මෝටර් වාහනවලට අදාළව තත්කාලයේ බලාත්මකව පවතින යම් ප්‍රඥප්තියක් යටතේ බද්දකට යටත් වන වාහන,

සම්බන්ධයෙන් මේ බද්ද අදාළ නොවේ.

## 07.4 ගාස්තුව

| | වාහන හා සතුන් වර්ගය | රු. ශත |
|---|---|---|
| 1. | මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින්රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25.00 |
| 2. | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| | (අ) වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18.00 |
| | (ආ) වෙළෙඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම් | 4.00 |
| 3. | සෑම කරත්තයක් සඳහා | 20.00 |
| 4. | සෑම අත් කරත්තයක් සඳහා | 10.00 |
| 5. | සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| 6. | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15.00 |
| 7. | සෑම ඇතෙකු සඳහා | 50.00 |

සටහන: ඉහත සඳහන් "වෙළෙඳ කාර්යය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

## 07.5 ඉදිරිපත් කළ යුතු ලේඛන

මෙහි ඇමුණුමේ සඳහන් ආකෘතියට අනුව, ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබූ වාහන හා සතුන් පිළිබඳ බදු නිවේදනය.

සටහන: මේ ලේඛනය ඉදිරිපත් කිරීමට යම් තැනැත්තෙකුට නොහැකි වන අවස්ථාවක, ඉහත සඳහන් යම් වාහනයක් හෝ සතෙකු තමන් භාරයේ තබා තිබෙන බවත් තමන් පදිංචි ස්ථානයේ ලිපිනය කුමක් ද යන්න ප්‍රකාශ කිරීම මඟින් මේ බද්ද ගෙවීමට ඒ තැනැත්තාට හැකියාව ඇත.

## 07.6 කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | බල ප්‍රදේශය තුළ තබා තිබෙන වාහන සහ ඇති කරන සතුන් පිළිබඳ සමීක්ෂණය කර, පී. එස්. 25 ආකෘතිය සම්පූර්ණ කිරීම | සෑම වර්ෂයක ම මාර්තු මස 31 දිනට පෙර | ආදායම් පරීක්ෂක |
| 2 | පී. එස්. 25 ආකෘතියේ සඳහන් යම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා තැනැත්තාට මෙහි ඇමුණුමේ ආකෘතියට අනුව පිළියෙළ කළ බදු නිවේදනය භාර දීමට සැලැස්වීම. | සෑම වර්ෂයක ම මාර්තු මස 31 දිනට පෙර | ලේකම් |
| 3 | අදාළ බද්ද ගෙවීම | සෑම වර්ෂයක ම අප්‍රේල් මස 30 දිනට පෙර | |
| 4 | අය කර ගත් බදු මුදලට අදාළව ලදු පතක් සහ වාහනයේ සවිකර තැබීමට හෝ සතාගේ යම් ස්ථානයක එල්ලා තැබීම සඳහා ලෝහ තහඩුව නිකුත් කිරීම | බදු මුදල අය කර ගත් අවස්ථාවේදීම | පෙරටු කාර්යාල නිලධාරි / මුදල් අයකැමි |

සටහන: මෙසේ අය කර ගනු ලබන්නේ බද්දකි. ඇතැම් අවස්ථාවල දී, මේ ආදායම බද්දක් වශයෙන් නොව බලපත්‍ර ගාස්තුවක් වශයෙන් හැඳින්වීම සිදු කරනු ලැබුව ද, එය සාවද්‍ය හැඳින්වීමකි.

## 07.7 බදු ගෙවීම පැහැර හැරීමේ ප්‍රතිවිපාක

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | බලපත්‍රය ලබා නොගත් අය වෙත සිහි කැඳවීම | | ලේකම් |
| 2 | බද්ද අය කර දෙන ලෙස මහේස්ත්‍රාත් වෙතින් ඉල්ලීමක් කිරීම | බද්ද ගෙවීමට නියමිත දින සිට දින 7 ක් ගත වීමෙන් පසු | ලේකම් |
| 3 | අය කළ යුතු බද්ද මහේස්ත්‍රාත් වරයා විසින් ගෙවීමට නියම කිරීම | | |